**CENTRE FOR MONITORING ELECTION VIOLENCE**
**මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය**
**தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்**
No 6/5, Layards Road, Colombo 05, **Tel:** +094-11 2505980/+094-11 2505293
**Fax**: +094-11 2505228 **E-mail**: cmev@cpalanka.org **Web**: www.cmev.org

**වසර 2019, අගෝස්තු මස 20 වැනි දින, කොළඹ - ශ්‍රී ලංකාව, ඉදිරි ජනාධිපතිවරණයේ අපේක්ෂක ගෝඨාභය රාජපක්ෂ මහතා, තම පුරවැසිබව ඉවත් කරගෙන සිටි සමයේ ජන්දහිමි නාම ලේඛනයේ ලියාපදිංචිව, ජන්දය භාවිත කර ඇතැයි යන කරුණ පිළිබඳ සාධාරණ පරීක්ෂණයක් නොපමාව පැවැත්විය යුතුය .**

තවත් නොබෝ දිනකින් පැවැත්වීමට නියමිත මෙරටේ අටවැනි ජනාධිපතිවරණය සඳහා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නියෝජනය කරමින් තරග කිරීමට නියමිත ආරක්ෂක අමාත්‍යංශයේ හිටපු ලේකම් නන්දසේන ගෝඨාභය රාජපක්ෂ මහතා තම ශ්‍රී ලාංකේය පුරවැසිබව ඉවත් කරගෙන සිටි සමයේ එවකට උපයෝගී කරගත් ජන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචිව සිට ඇතැයි යනුවෙන් පළව ඇති මාධ්‍ය වාර්තා පිළිබඳව මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය තම බලවත් අවධානය යොමුකර ඇත. එහිලා සති අන්ත සිංහල මාධ්‍ය පුවත්පත් නියෝජ්‍ය කතුවරයෙක් මේවනවිටත් මැතිවරණ කොමිෂන් සභාව වෙත පැමිණිලි කොට ඇති අතර එකී පැමිණිල්ල පිළිබඳ කොමිෂන් සභා තීරණය ලබාදීමට නියමිතව පැවතියේ පෙර දිනයේය.

එහි පවත්නා වඩාත් බරපතල තත්වය නම් ඔහු මෙරටේ පුරවැසියෙක් ව නොසිටි පසුබිමකදී, හම්බන්තොට දිස්ත්‍රික්කයේ මුල්කිරිගල මැතිවරණ කොට්ඨාශය යටතේ වාර්ෂික ජන්දහිමි නාම ලේඛනයේ ලියාපදිංචිව තිබීමයි. ඊට අමතර වශයෙන් වසර 2005 මෙරටේ පැවැත්වූ පස්වැනි ජනාධිපතිවරණයේදී ඔහු තම ජන්දය ද භාවිත කර ඇතැයි යනුවෙන් චෝදනා නැගී ඇත. මෙරටේ ජනාධිපතිවරණය හා සබැඳි මැතිවරණ නීතිය බලාත්මක කොට ඇත්තේ 1981 අංක 15 දරන ජනාධිපතිවරණ මැතිවරණ පනත මගින්ය. එකී පනතේ ප්‍රකාර මෙලෙස ව්‍යාජ ලෙස ජන්දහිමි නාම ලේඛනයේ ලියාපදිංචි වීම හා ජන්දය භාවිත කිරීම අධිකරණය හමුවේ දඬුවමට ලක්විය හැකි වරදක් ලෙස දක්වා ඇත. එපමණක් නොව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 (අ) ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලාංකීය පුරවැසියෙක් නොවන්නෙකුට පාර්ලිමේන්තු හෝ ජනාධිපතිවරණය යන එකදු මැතිවරණයකදී මෙන්ම ජනමත විමසුමකදී ද තම ජන්දය භාවිත කිරීමේ හැකියාවක් නොමැත.

දැනටමත් මාධ්‍ය වාර්තා කොට ඇති පරිදි ජනාධිපතිවරණ අපේක්ෂක ගෝඨාභය රාජපක්ෂ මහතා තම ඇමෙරිකානු පුරවැසිබව ලබා ගෙන ඇත්තේ වසර 2003 දීය. අනතුරුව වසර 2005 සැප්තැම්බර් මස 04 වැනි දින මෙරටට ගොඩබැසීමෙන් පසු ගුවන් තොටුපළේදී ලබාගත හැකි සංචාරක වීසා බලපත්‍රයක් යටතේ මෙරටට ඇතුලුව ඇති රාජපක්ෂ මහතා එකී කාල සීමාව තුළ තම සොහොයුරා වූ මහින්ද රාජපක්ෂ මහතාගේ ජනාධිපතිවරණ මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා ද තම දායකත්වය දක්වා ඇත්තේය. දින තිහකට පමණක් වලංගු සංචාරක වීසා බලපතක් යටතේ මෙරට ට ඇතුලුව එලෙස මැතිවරණ කටයුතු සඳහා සහභාගී වීම ද මෙරටේ ආගමන හා විගමන පනත් ප්‍රකාර (45 (1) (ඒ) අදාළ කොන්දේසි කඩකිරීමක් මෙන්ම දඬුවම් ලැබිය හැකි වරදක් ද වන්නේය.

මැතිවරණ නිරීක්ෂණ සංවිධානයක් ලෙස අප සංවිධානය නිරන්තරයෙන් අවධාරණය කරමින් පවත්නා කරුණක් වන්නේ මෙරටේ පිරිසිදු දේශපාලන සංස්කෘතියක් ගොඩනැගීමෙහිලා පවත්නා එක් බරපතල බාධාවක් ව ඇත්තේ නීතියේ ආධිපත්‍යය නිසිලෙස තහවුරු නොවීම හා ළබැඳියාවන් අතර පවත්නා පිළිගැටුමයි. රාජපක්ෂ මහතා හා සබැඳි ඉහත ක්‍රියා පිළිවෙල විමසීමේදී තහවුරු වන එක් කරුණක් නම් ඔහු තම සිතැඟි පරිදි රටෙහි ස්ථාපිතව පවත්නා මැතිවරණ නීතිය මෙන්ම සාමාන්‍ය නීතිය ද උල්ලංඝනය කොට ඇති බවයි.

නීතිය අභියස සියල්ලන් සමාන විය යුතුයැයි යන්න නීතියේ මූලික සංකල්පයක් වුවද රාජපක්ෂ මහතා ක්‍රියා කොට ඇති ආකාරයෙන් පෙනී යන්නේ ඔහු රටෙහි සාමාන්‍ය නීතිය අභිබවා ක්‍රියා කොට ඇති බවයි. ඔහු මෙරටේ අටවැනි විධායක ජනාධිපතිවරයා බවට පත්වීම සඳහා අතිශය දැවැන්ත මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයක් ද දැනටමත් දියත් කොට ඇති අතර ඉහත මතුකොට ඇති චෝදනා හමුවේ ඔහු තම නිරවද්‍යබව තහවුරු කිරීම අවශ්‍යයෙන්ම සිදුකල යුත්තක් ය යන්න මැ. ප්‍ර. ක්‍රි. නි. ම. ස්ථාවරයයි.

තම ද්විත්ත්ව පුරවැසිබව ඉවත්කරගැනීම පිලිබඳ ව විවිධ පාර්ශව චෝදනා නැගුවද එකී චෝදනා හමුවේ පවා නිහඬව සිටිමින් අඛණ්ඩ ව මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයෙහි යෙදී සිටින රාජපක්ෂ මහතාගේ ක්‍රියාකලාපය නිසැකවම මැතිවරණ ක්‍රියාවලියක පැවතිය යුතු සුපිලිපන්නබව අභියෝගයට ලක් කරන්නේය. ජන්ද හිමියන් වාර්ෂිකව ලියාපදිංචි කිරීම යනු එකී කොමිෂන් සභාවට ව්‍යවස්ථාපිතව හිමිව ඇති නිශ්චිත වගකීමකි. එය ඉහළ නිරවද්‍යතාවකින් යාවත්කාලීන කිරීම අදාළ කොමිෂන් සභාව මගින් අපේක්ෂා කරන අතර ම ඔවුන් වෙත නිර්ව්‍යාජ තොරතුරු ලබා දී මැතිවරණයක පැවතිය යුතු නිදහස් හා සාධාරණ බව තහවුරු කිරීම සියලු සුදුසුකම් ලත් ජන්ද හිමියන් සතු පරම වගකීමකි. එහෙත් ඉහත සඳහන් කල ක්‍රියාදාමය තුළින් පැහැදිලි වන එක් කරුණක් වන්නේ ජන්ද හිමියන් ගණන් ගැනීමේ ක්‍රියාවලිය සතුව පැවතිය යුතු විශ්වසනීයත්වය මෙවැනි අකටයුතුකම් හමුවේ බිඳ වැටිය හැකි බවයි.

ඒ අනුව මැතිවරණ කොමිෂන් සභාව සතුව මේ මොහොතේ ඉතා බරපතල වගකීමක් ඇත්තේය. එනම් මෙකී ක්‍රියාවලිය පිලිබඳ කඩිනම් හා සාධාරණ පරීක්ෂණයක් පැවැත්වීමත්, ව්‍යාජ තොරතුරු සපයමින් මැතිවරණ නීති උල්ලංඝනය කොට ඇති පාර්ශව අනාවරණය කරගැනීමත්ය. මැතිවරණ කොමිෂන් සභාව මෙන්ම මෙම සිද්ධිදාමය හා සබැඳි අනෙකුත් පාර්ශව මෙහිලා දක්වන අපක්ෂපාතී අනලස් මැදිහත්වීම, මෙරටේ මැතිවරණ ක්‍රියාවලිය කෙරෙහි ජන්දදායකයන්ගේ විශ්වාසය අඛණ්ඩව රඳවා තබා ගැනීමට මහෝපකාරී වන බව මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයේ ස්ථාවරයයි.